# ලංසු සඳහා ආරාධනයයි

## ආරක්ෂක අමාත්‍යාංශය

## ආරක්ෂක අමාත්‍යාංශයට වසර පහක කාලයක් සඳහා මෙහෙයුම් බදු ක්‍රමය යටතේ මෝටර්රථ නවයක් (9) ක් කුලියට ගැනීම

### කොන්ත්‍රාත් අංක : MOD/SUP/08/02/01/2023

1. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන්, ආරක්ෂක අමාත්‍යාංශයේ, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකාව, ආරක්ෂක අමාත්‍යාංශයට වසර පහක කාලයක් සඳහා මෙහෙයුම් බදු ක්‍රමය යටතේ මෝටර්රථ නවයක් (9) කුලියට ගැනීම සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. ප්‍රසම්පාදනය සඳහා වන වාහන හා අනෙකුත් විස්තර පහත සඳහන් පරිදි වේ.

| ප්‍රසම්පාදන යොමු අංකය | වාහන පිළිබද විස්තර | ප්‍රමාණය | ලංසු සුරක්ෂණයේ වටිනාකම රු. | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව - රු. |
|---|---|---|---|---|
| MOD/ SUP/08/02/01/ 2023 | ශ්‍රී ලංකාව, ආරක්ෂක අමාත්‍යාංශයට වසර පහක කාලයක් සඳහා මෙහෙයුම් බදු ක්‍රමය යටතේ වාහන නවයක් (9) කුලියට ගැනීම | 09 | 1,620,000.00 | 25,000.00 |

2. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රමය මගින් මෙහෙය වනු ලැබේ.

3. අභිලාෂී යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට, 2023-06-12 දින සිට 2023-07-04 දින තෙක් කාර්යාල දිනයන්හි (රජයේ හා බැංකු නිවාඩු දින හැර) 9.00 පැය සිට 15.00 පැය දක්වාද, කෝට්ටේ, ශ්‍රී ජයවර්ධනපුර, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ, ආරක්ෂක අමාත්‍යාංශයේ ගණකාධිකාරී (සැපයුම්) වෙතින් දුරකථන අංක 0112430860-9 (දිගුව 10504), ෆැක්ස් 0112433517, modsupplysl@gmail.com මගින් වැඩිමනත් තොරතුරු ලබා ගැනීමටත්, පහත දැක්වෙන ලිපිනයේදී ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් පිළිවන .

4. සුදුසුකම්ලත් ලංසුකරුවන්ට ඉහත ප්‍රසම්පාදනය සඳහා නෛතික අයිතිය තිබිය යුතුය. ලංසුකරුවන්, 1990 අංක 4 දරන ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තියෙන් ඒකාබද්ධ කරන ලද (149 අධිකාරිය වූ) ව්‍යාපාර නාම ආදාළ පනත යටතේ නිකුත් කරන ලද සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් සහ 1982 අංක 17 දරන අධ්‍යක්ෂ පනතේ (48 පත්‍රිකාව) විස්තරවල පිටපතක්ද ඉදිරිපත් කළ යුතුය. තවද ලංසුකරු විසින් 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ නිකුත් කළ ලියාපදිංචි සහතිකයේ මුල් පිටපතද ලංසු සමග ඉදිරිපත්කල යුතුය. ලංසුකරුවන් සතුව බැඳියාව පිළිබඳ පිළිගැටුමක් නොතිබිය යුතු අතර ලංසුකරුගේ නම ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ / කොමිෂන් සභාවේ තහනම් සමාගම් ලැයිස්තුවේ ඇතුලත් නොවිය යුතුය. ලංසුකරුවන්ට ශ්‍රී ලංකා රුපියල් හැරෙන්නට වෙනත් මුදල් වර්ගයකින් මිල ගණන් ඉදිරිපත් කිරීමට අවසර නොලැබෙන අතර කොන්දේසි සහිත ලංසු භාර නොගැනේ.

5. ආරක්ෂක අමාත්‍යාංශයේ ගණකාධිකාරී (සැපයුම්) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් ඉහත සඳහන් ගාස්තු ගෙවීමෙන් අනතුරුව, කෝට්ටේ, ශ්‍රී ජයවර්ධනපුර, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ, ආරක්ෂක අමාත්‍යාංශයේ, සැපයුම් ශාඛාවෙන් 2023-06-12 දින සිට 2023-07-04 දින තෙක් ඕනෑම කාර්යාල දිනයක 0900 පැය සිට 1500 පැය දක්වා, අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදීගත හැකිය. ගෙවීම් කළයුත්තේ මුදලිනි.

6. ලංසු, 2023-07-05 දින 1100 පැයට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතුය. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම, එහි පැමිණ සිටීමට බලාපොරොත්තු වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී, 2023-07-05 දින 1100 පැයට, කෝට්ටේ, ශ්‍රී ජයවර්ධනපුර, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ ආරක්ෂක අමාත්‍යාංශයේ සම්මන්ත්‍රණ ශාලාවේදී ලංසු විවෘත කෙරේ. ලංසුකරුවන් වෙනුවෙන් සහභාගී වන නියෝජිතයන් ආයතනයෙන් ලබාගත් බලය පැවරූ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

7. ලංසු, ලංසුකරණ ලිපිලේඛනවල සඳහන් කාල සීමාව දක්වා වලංගු විය යුතුය.

8. සියලුම ලංසු සමඟ;

   i. ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත කළ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින්,

   ii. ලේකම් / ආරක්ෂක අමාත්‍යාංශ නමින්,

   iii. ඉහත සඳහන් වටිනාකමට නිකුත් කළ

   iv. ලංසුකරණ ලිපිලේඛනයේ 09 වන වගන්තියේ ඇතුලත් ආකෘතියට අනුව, දින 119 ක් දක්වා එනම් 2023-07-05 දින සිට 2023-11-01 දින තෙක් වලංගු කොන්දේසි විරහිත ඒක්ෂණ ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.

9. ප්‍රසම්පාදන කමිටුව විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වන අතර, වාරිකව නිකුත් කෙරෙන මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාර චක්‍රලේඛ මත ඕනෑම සංශෝධනයක් සිදුකිරීමේ අයිතිය ගැනුම්කරු සතුවේ.

10. ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වන බලයලත් පුද්ගලයාගේ නම සහ ජාතික හැඳුනුම්පත් / පාස්පෝට් අංකය ලංසු විවෘත කරන දිනට අඩුතරමින් දින තුනකට (03) පෙර, ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී - 1 වෙත ලිඛිතව දැනුම් දෙන ලෙස ලංසුකරුවන්ට අවවාද කෙරේ.

11. වැඩිමනත් පැහැදිලි ගර ගැනීම් සඳහා අමතන්න.


**ගණකාධිකාරී (සැපයුම්),**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.**

**දුරකථනය : 0112430860 - 9 (දිගුව) - 10504**
**ෆැක්ස් අංකය : 011-2433517**
**ඊමේල් :** modsupplysl@gmail.com

**සභාපති,**
**අමාත්‍යාංශය ප්‍රසම්පාදන කමිටුව,**
**ආරක්ෂක අමාත්‍යාංශය**